# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/04/LH/09/ගෙවතු/2022 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ............ | දිනය<br>திகதி<br>Date | 2022.02.17 |
|---|---|---|---|---|---|

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන්,
සියළුම සමෘද්ධි කළමණාකරුවන් හා සමෘද්ධි සංවර්ධන නිලධාරින් වෙත,

**හරිත දැයක් ජාතික කෘෂි ගෙවතු සංවර්ධන වැඩසටහන - 2022 පෙබරවාරි**
**තවාන් බීජ බෙදා හැරීම**

උක්ත වැඩසටහනට අදාළව දිවයිනේ සියළුම ග්‍රාම නිලධාරි වසම් ආවරණය වන පරිදි ඉදිරියේදී හඳුනාගනු ලබන සියළුම ගෙවතුලාභීන්ට අවශ්‍ය තවාන් පැල සම්පාදනය පිණිස පැල තවාන් හිමියන් හඳුනාගෙන අප දෙපාර්තමේන්තුවේ CRM පද්ධතියට ඇතුළත් කිරීමේ කටයුතු අවසන්ව ඇත. එම තවාන්කරුවන් පිළිබඳව මෙම වැඩසටහනට සම්බන්ධ කෘෂිකර්ම අමාත්‍යාංශය, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා ගොවිජන සේවා දෙපාර්තමේන්තුව වෙත දැනටමත් යොමු කර ඇත. ඒ අනුව දිස්ත්‍රික් මට්ටමින් දැනටමත් CRM පද්ධතියට ලියාපදිංචි වී ඇති තවාන්කරුවන්ගේ සංඛ්‍යාව ඇමුණුම් අංක 1මඟින් දක්වා ඇති අතර මොවුන් සඳහා වන තාක්ෂණික පුහුණු වැඩසටහන් සියළුම ගොවිජන සේවා මධ්‍යස්ථාන වලදී පවත්වා අවසන්ව ඇත. (කුණ්ඩසාලේ හා දිඹුලාගල (මහවැලි C කලාපය) යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හැර)

02. ආර්ථික පුනර්ජීවනය සහ දරිද්‍රතාවය පිටුදැකීම සඳහා වන ජනාධිපති කාර්ය සාධන බලකායේ උපදෙස් මත පහත සඳහන් ආකාරයට තවාන් බීජ බෙදා හැරීම කළ යුතු වේ. ඒ අනුව අදාළ පැල තවාන් හිමියන් වෙත කඩිනමින් වම්බටු, මිරිස්, තක්කාලි සහ මාළුමිරිස් / වැරණිය මිරිස් යන බෝග වල තවාන් බීජ ලබාදිය යුතු බැවින් ඒ ඒ දිස්ත්‍රික්ක වෙත අවශ්‍ය වන බීජ ප්‍රමාණයන් 50g පැකට් ලෙස අසුරා ඔබ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා වෙන්කර ඇත. මෙහිදී තෙත් කලාපයට අයත් දිස්ත්‍රික්ක සඳහා මාළු මිරිස් වෙනුවට වැරණිය මිරිස් නිකුත් කරනු ඇත.කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ හා රෝපණ ද්‍රව්‍ය සැකසුම් මධ්‍යස්ථානයෙන් ලබාදී ඇති මහපෙන්වීම අනුව තවාන් බීජ එක් ග්‍රෑමයක අඩංගු බීජ ප්‍රමාණය පහත පරිදි වන අතර ඔබ වෙත වෙන් වෙන බීජ පැකට් ප්‍රමාණය පිළිබඳ තොරතුරු ඇමුණුම් අංක 2 හා 3 මඟින් දක්වා ඇත.

| | |
|---|---|
| වම්බටු 290 බීජ (ග්‍රෑමයක) | මාළු මිරිස් 145 බීජ (ග්‍රෑමයක) |
| මිරිස් 206 බීජ (ග්‍රෑමයක) | තක්කාලි 300 බීජ (ග්‍රෑමයක) |

D/Live/Sen/තවාන් බීජ බෙදා2.17


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. 7ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல/1st Step, 4 th floor, Sethsiripaya Batt

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | Hot Line:0112-885582 | Hot Line: 01 |
| | | Hot Line :0112-889007 | | | |

එනම් 50g ක තවාන් බීජ ඇසුරුමක අඩංගු බීජ සංඛ්‍යාව පහත සඳහන් පරිදි වුවද ග්‍රෑම් 50 ක එක් තවාන් බීජ පැකට්ටුවකින් නිෂ්පාදනය කළ හැකි පැල සංඛ්‍යාව පිළිබඳව පැකට්ටුවේ සඳහන් කර ඇත.

| | |
|---|---|
| වම්බටු 14,500 | මාළු මිරිස් 7,250 |
| මිරිස් 10,200 | තක්කාලි 15,000 |

03. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය හා නිසි උපදෙස් ගන්නොරුව බීජ හා රෝපණ ද්‍රව්‍ය සැකසුම් මධ්‍යස්ථානයේ අතිරේක අධ්‍යක්ෂ වෙත මේ වන විට ලැබී ඇති අතර තවාන් බීජ බෙදා හැරීම 2022 පෙබරවාරි 18 දින සිට ඔබ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සමෘද්ධි අංශය වෙත ප්‍රධාන කාර්යාලය මඟින් සපයනු ඇත.

04. මුදල් අමාත්‍යාංශය හා ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යයසාධන බලකාය මඟින් 'හරිත දැයක් ජාතික කෘෂි ගෙවතු සංවර්ධන වැඩසටහන' සම්බන්ධයෙන් ලබාදී ඇති උපදෙස් අනුව සියළු යෙදවුම් ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා බෙදා හැරිය යුතු බැවින් ඔබ වෙත ලබාදෙන තවාන් බීජ ඇසුරුම් ලබාගෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් වෙන් කර විධිමත් අයුරින් ඊට අදාල ගොවිජන සේවා මධ්‍යස්ථාන වල ප්‍රාදේශීය නිලධාරීන් වෙත භාර දිය යුතු වේ.

05. තවාන්හිමියන් වෙත තාක්ෂණික පුහුණු වැඩසටහන් වලදී ලබා දුන් උපදෙස් පරිදි නියමිත සනකමින් යුතු පොලිතින් භාවිතා කර පැල 10 ක් රෝපණය කළ හැකි වනසේ ඇසුරුම් සකසා නියමිත පාංශු මාධ්‍ය භාවිතා කර තවාන් පැල භෝග වර්ග 4 ට අදාළව වෙන වෙන ම සකස් කළ යුතු අතර බීජ සිටුවීම සඳහා අවශ්‍ය වන පොලිතින් තවාන්හිමියන් විසින් සපයාගත යුතු වේ. මේ සඳහා සුළු බැංකු ණය මුදලක් අවශ්‍ය වන්නේ නම් සමෘද්ධි ප්‍රජා මූල බැංකුවේ සහාය ලබාදීමට කටයුතු කළ යුතු වේ. එක් ගෙවතුලාභියෙකු වෙත නිරෝගීව හොඳින් වැඩුණු පැල 10 බැගින් භෝග වර්ග 4 න් පැල 40 ක් ලබා දිය යුතු වේ. එක් බෝග වර්ගයක එක් පැලයක් සඳහා රු. 4.50 ක මිලක් තවාන්කරුට ගෙවීමට කටයුතු කරනු ඇත.

06. ඉඩම් පරිහරණ සැලසුම් දෙපාර්තමේන්තුව විසින් 2020 වර්ෂයේ එළිදක්වන ලද ක්ෂේත්‍ර වාර්තාව අනුව එක් එක් දිස්ත්‍රික්ක අනුව පවත්නා ගෙවතු ඒකක සංඛ්‍යාව පිළිබඳව තොරතුරු luppd.gov.lk යන වෙබ් ලිපිනයට ඇතුලත් වීමෙන් ලබා ගත හැකි අතර එහි සෙවීම් තීරුවේ (Search) ගෙවතු වගා වාර්තා වෙත පිවිස (Home Garden Reports) වල ඒ ඒ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හා ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් පවත්නා ගෙවතු ඒකක පිළිබඳ තොරතුරු ලබාගත හැකි වේ.(පර්චස් 20 ට අඩු ගෙවතු , පර්චස් 20 සිට අක්කර1 අතර පවත්නා ගෙවතු හා අක්කරයට වැඩි ගෙවතු ලෙස ගෙවතු තොරතුරු ලබාගත හැකි වේ.) මෙම මුළු ගෙවතු වලින් 50% ක ප්‍රමාණයක් සඳහා තවාන් පැල නිෂ්පාදනය කරන ලෙස ජනාධිපති කාර්යය සාධන බලකාය විසින් උපදෙස් ලබාදී ඇත. මේ පිළිබඳ සියළු තොරතුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරී හෝ එම දෙපාර්තමේන්තුවේ සංවර්ධන නිලධාරී ඇමතීමෙන් ලබා ගත හැකි වේ.

07. කෙසේ වුවද ඔබගේ පහසුව පිණිස ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ ඉහත වාර්තාව අනුව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් අනුව පවත්නා ගෙවතු ඉඩම් පිළිබඳව තොරතුරු ඔබ දිස්ත්‍රික්කය වෙත මේ සමඟ ඊමේල් කරන අතර ඒ අනුව එක් එක් ග්‍රාම නිලධාරී වසම් වල මුළු ගෙවතු ප්‍රමාණයෙන් 50% ක් වන ලෙස තවාන්කරුවන් මඟින් පැල නිෂ්පාදනය කිරීමට කටයුතු කළ යුතු වේ. ඒ අනුව ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ප්‍රාදේශීය නිලධාරී වෙතින් ලබා ගන්නා බීජ ඇසුරුම් කෘෂිකර්ම උපදේශකවරුන්, කලාප කළමණාකරුවන්, සමෘද්ධි සංවර්ධන නිලධාරීන් හා කෘෂි පර්යේෂණ නිෂ්පාදන සහකාරවරුන්ගේ ද සහාය ඇතිව ව්‍යාපෘති කළමණාකරුවන් විසින් ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් පවතින ගෙවතු ඒකක සංඛ්‍යාව අනුව වෙන්කර අදාල පැල තවාන්කරුවන් වෙත ලබාදීමට වග බලා ගත යුතු අතර බීජ ප්‍රරෝහණ ප්‍රතිශතය 75% ක් ලෙස උපකල්පනය කර බීජ වෙන් කර දිය යුතු වේ.